ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය
## ඉන්දීය විදේශ ලේකම්තුමාගේ ශ්‍රී ලංකා සංචාරය

ඉන්දීය විදේශ ලේකම් ශ්‍රී හර්ෂ් වර්ධන් ශ්‍රිංග්ලා මහතා තෙදින නිල සංචාරයක් සඳහා 2021 ඔක්තෝබර් 02-05 යන දිනයන්හිදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. මෙය විදේශ ලේකම් වශයෙන් එතුමාගේ ප්‍රථම ශ්‍රී ලංකා සංචාරය විය. සංචාරය අතරතුර දී විදේශ ලේකම්තුමා ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ, අග්‍රාමාත්‍ය අතිගරු මහින්ද රාජපක්ෂ, මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ සහ විදේශ අමාත්‍ය ගරු මහාචාර්ය ජී. එල්. පීරිස් යන මහත්වරුන් හමු විය.එතුමා වතු නිවාස සහ ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය ගරු ජීවන් තොණ්ඩමන්, විදේශ ලේකම් අද්මිරාල් (විශ්‍රාමික) මහාචාර්ය ජයනාත් කොළඹගේ සහ ආරක්ෂක ලේකම් ජෙනරාල් (විශ්‍රාමික) ජී. ඩී. එච්. කමල් ගුණරත්න යන මහත්වරුන් සමඟ ද ඵලදායි සාකච්ඡාවන්හි නිරත විය.

2. ජනාධිපතිතුමා සමඟ 2021 ඔක්තෝබර් 5 වන දින පැවති හමුවේදී, විදේශ ලේකම්තුමා ගුවන් සහ මුහුදු මාර්ගයෙන් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සම්බන්ධකතාවය ඉහළ නැංවීමට වන යෝජනා ඇතුළු අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායි ව්‍යාපෘතීන් කඩිනමින් ඉදිරියට ගෙනයාම උදෙසා ඉන්දියාව ලබාදෙන වැදගත්කම අවධාරණය කළේය. විදේශ ලේකම්තුමා ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය යන ක්ෂේත්‍රයන් තුළ ජනාධිපතිතුමා විසින් ලබාදෙන මහ පෙන්වීම සහ සමීප සහයෝගීතාවය වෙනුවෙන් සිය ස්තුතිය පළ කළේය. බලය බෙදාහැරීම සහ පළාත් සභා මැතිවරණය හැකි ඉක්මනින් පැවැත්වීම ඇතුළු 13 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ පවතින විධි විධාන සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඉන්දියාවේ ස්ථාවරය ද විදේශ ලේකම්තුමා විසින් මෙහිදී අවධාරණය කරන ලදී.

3. අග්‍රාමාත්‍යතුමා සමඟ 2021 ඔක්තෝබර් 4 වන දින පැවති හමුවේදී, විදේශ ලේකම්තුමා ඉන්දු - ශ්‍රී ලංකා සබඳතා දෙරටෙහි ජනතාව අතර පවතින විචිත්‍රවත් සබඳතාවයන් මත පදනම් වන බව ද බෞද්ධ කටයුතු සඳහා ලබා දෙන ලද ඇමරිකානු ඩොලර් මිලියන 15ක ප්‍රදානය සඳහා වන ගිවිසුම දෙරට රජයන් අතර අත්සන් තැබීම සමඟින් එම බැඳීම් තවදුරටත් ශක්තිමත් වනු ඇති බව ද සඳහන් කළේය. යාපනය ප්‍රදේශය සමඟ පවතින ඉන්දියාවේ ශක්තිමත් සංස්කෘතික සහ ශිෂ්ටාචාරමය සබඳතා සිහිපත් කළ විදේශ ලේකම්තුමා ඉන්දීය ප්‍රදාන යටතේ ඉදිකළ යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා ඉන්දියානු රජය ශ්‍රී ලංකා රජයට සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කළේය. තව ද ඉන්දියානු රජය කුෂිනගර් වෙත පළමු ගුවන්යානය ශ්‍රී ලංකාවෙන් අපේක්ෂා කරන බව ද එය දෙරට අතර සංස්කෘතික බැඳීම් තවදුරටත් ශක්තිමත් කරනු ඇතැයි ද විදේශ ලේකම්තුමා සඳහන් කළේය.

4. මුදල් අමාත්‍යතුමා සමඟ පැවති හමුවේදී ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින ශක්තිමත් ආර්ථික සහ වාණිජ සබඳතා පිළිබඳව අවධානය යොමු විය. ඉන්දියානු රජය විසින් ලබාදෙන ලද ණය ආධාර සහ ප්‍රදාන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතීන් ඇතුළු ඒකාබද්ධ ව්‍යාපෘතීන් ඉදිරියට ගෙනයාමට දෙපාර්ශවය මෙහිදී එකඟ විය. විදේශ ලේකම්තුමාශ්‍රී ලංකා විදේශ අමාත්‍යතුමා සහ විදේශ ලේකම්තුමා සමඟ කොවිඩ්-19 වසංගතය විසින් මතු කර ඇති අභියෝගයන් හේතුවෙන් ඇති වී ඇති ආර්ථික බලපෑම සමනය කිරීම සඳහා එක්ව කටයුතු කිරීමෙ අවශ්‍යතාවය ඇතුළු සියළු අංශයන්හි අන්‍යෝන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන කරුණු රැසක් සම්බන්ධයෙන් පුළුල් සාකච්ඡාවන්හි නිරත විය.

5. සංචාරය අතරතුරදී විදේශ ලේකම්තුමා මහනුවර, ත්‍රිකුණාමලය සහ යාපනය ප්‍රදේශයන්හි සංචාරය කළ අතර එතුළින් පිළිවෙළින් එම ප්‍රදේශයන්හි සංස්කෘතික, ආර්ථික සහ ඓතිහාසික වැදගත්කම පිළිඹිබු විය. මහනුවරට ගිය විදේශ ලේකම්තුමා ශ්‍රී දළදා මාලිගාව වැඳ පුදා ගත්තේය. විදේශ ලේකම්තුමා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර විභව්‍ය සහ ශක්තිමත් බලශක්ති සහයෝගීතාවයේ සංකේතයක් වන ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණයේ සංචාරයක නිරත වූ අතර එහිදී LIOC ආයතනය පහළ ටැංකි සංකීර්ණයේ ක්‍රියාත්මක සංවර්ධන වැඩ කටයුතු ද එමඟින් ශ්‍රී ලංකා ආර්ථිකයට හිමිවන

ප්‍රතිලාභ සම්බන්ධයෙන් ද විදේශ ලේකම්තුමාව දැනුවත් කළේය. සිය යාපනය සංචාරය අතරතුර දී විදේශ ලේකම්තුමා යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය නිරීක්ෂණය කළ අතර උතුරු පළාත් ආණ්ඩුකාරතුමා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, විද්වතුන් සහ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ නායකයන් රැසක් හමු විය.

6. කම්කරු අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා, අධ්‍යාපන අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන, විදේශ අමාත්‍ය මහාචාර්ය ගරු ජී. එල්. පීරිස්, ධීවර අමාත්‍ය ගරු ඩග්ලස් දේවානන්ද, වනජීවී සහ වන සංරක්ෂණ අමාත්‍ය ගරු සී. බී. රත්නායක, සෞඛ්‍ය අමාත්‍ය ගරු ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල, වැවිලි අමාත්‍ය ගරු වෛද්‍ය රමේෂ් පතිරණ යන මහත්වරුන් සහ රාජ්‍ය අමාත්‍යවරුන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් රැසකගේ සහභාගීත්වයෙන් අරලිය ගහ මන්දිරයේ දී පැවැති උත්සවයක දී විදේශ ලේකම්තුමා ඉන්දීය ප්‍රදාන යටතේ සම්පූර්ණ කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් 4 ක් අතථ්‍ය ආකාරයෙන් අදාළ අමාත්‍යවරුන් සමඟ ජනතා අයිතියට පත් කළේය. මෙහිදී උතුරු පළාතේ වඩමාරච්චි මධ්‍ය කාන්තා විද්‍යාලයේ සහ මහනුවර දිස්ත්‍රික්කයේ පුස්සැල්ලාව සරස්වතී මධ්‍ය මහා විද්‍යාලයේ ගොඩනැගිලි ගරු අධ්‍යාපන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධනමැතිතුමා සමඟ ද ඉන්දීය නිවාස ව්‍යාපෘතියේ තෙවන අදියර යටතේ ඉදිකරන ලද නිවාස 1235 ක් වතු නිවාස සහ ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය ජීවන් තොණ්ඩමන් මැතිතුමා සමඟ ද වවුනියාව දිස්ත්‍රික්කයේ ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද නිවාස ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය ඉන්දික අනුරුද්ධ හේරත් යන මැතිතුමා සමඟ ද එක්ව අතථ්‍ය ආකාරයෙන් විවෘත කරන ලදී.

7. මෙම අවස්ථාවේදී සිය සතුට ප්‍රකාශ කරමින් විදේශ ලේකම්තුමා ප්‍රකාශ කළේ නව නිවාස සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් ව්‍යාපෘතීන් ජනතා අයිතියට පත් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ සමාජ - ආර්ථික දියුණුව සඳහා සහයෝගය ලබාදීමට ඉන්දියාව දක්වන දැඩි කැපවීම පිළිඹිබු වන බවයි. මෙම ව්‍යාපෘතීන් ශ්‍රී ලංකාව සමඟ ඉන්දියාවේ සංවර්ධන සහයෝගීතාවයේ ස්වභාවය සහ පරාසය ද පෙන්නුම් කරයි.

8. 2021 ඔක්තෝබර් 2 වන දිනට යෙදුණු මහත්මා ගාන්ධිතුමාගේ ජන්ම සංවත්සරය සහ 'අසාදි කා අම්රිත් මහෝත්සව්' සමරමින් විදේශ ලේකම් ශ්‍රී

ශ්‍රිංග්ලා මහතා විදේශ අමාත්‍යතුමා, ධීවර අමාත්‍යතුමා සහ වතු නිවාස සහ ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා සමඟින් අරලිය ගහ මන්දිරයේ තිබෙන ගාන්ධිතුමාගේ උඩුකය පිළිරුවට පුෂ්පෝපහාර දැක්වූයේ එතුමාගේ සාමයේ සහ අවිහිංසාවේ පණිවිඩය සිහිපත් කරමිනි.

9. විදේශ ලේකම්තුමා පාර්ලිමේන්තු මන්ත්‍රී සහ ද්‍රවිඩ ජාතික සන්ධානයේ (TNA) නායක ගරු ආර්. සම්බන්ධන් මහතා ප්‍රමුඛ TNA නියෝජිතයන්, පාර්ලිමේන්තු මන්ත්‍රී මනෝ ගනේෂන් මහතාප්‍රමුඛ දමිළ ප්‍රගතිශීලී සන්ධානයේ නියෝජිතයන් සහ වතු නිවාස සහ ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය ජීවන් තොණ්ඩමන්මහතා ප්‍රමුඛ ලංකා කම්කරු කොංග්‍රසයේ නියෝජිතයන් සමඟ ද සාකච්ඡාවන් හි නිරත විය. 13 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව එක්සත් ශ්‍රී ලංකාවක් තුළ සමානාත්මතාවය, යුක්තිය, සාමය සහ අභිමානය උදෙසා දමිළ ප්‍රජාවගේ අභිලාෂයන් ආමන්ත්‍රණය කරන සංහිඳියාව වෙනුවෙන් ඉන්දියාවේ දිගුකාලීන සහයෝගය විදේශ ලේකම්තුමා විසින් මෙහිදී අවධාරණය කරන ලදී.

10. සියළු පාර්ශවයන් සමඟ පැවති පුළුල් සහ සුහද සාකච්ඡා සහ විවෘත කරන ලද සංවර්ධන සහයෝගිතා ව්‍යාපෘතීන් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින සමීප, මිත්‍රශීලී සහ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායි සබඳතා තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

*****

කොළඹ
2021 ඔක්තෝබර් 05